2020 . 7 . 28 . ලංකාදීප    පිටු 01

# ජන-නිවාස සංගණනය ලබන වසරේ

**(ඩයනා උදයංගනී)**

**ශ්‍රී ලංකාවේ මීළඟ ජන හා නිවාස සංගණනය ලබන වසරේ දී පැවැත්වීමට නියමිත අතර මෙවර කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එහි සැලසුමේ වෙනස්කම් කිහිපයක් සිදුකිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබේ.**

ජන හා නිවාස සංගණනය වසර 10කට වරක් පවත්වනු ලබන අතර මෙවර එහි ලැයිස්තුගත කිරීමේ කටයුතු පසුගිය ජූලි මාසයේ ආරම්භ කිරීමට නියමිතව තිබුණත් එය ලබන වසරේ ජනවාරි මස සිට මැයි දක්වා සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇත.

ඊට අමතරව එහි ගණන් ගැනීමේ අදියර ලබන ජූනි සිට නොවැම්බර් දක්වාත්, දත්ත ප්‍රචාරණය කිරීම නොවැම්බර් සිට 2022 වසරේ මැයි මස දක්වාත්, ගණන් ගැනීමේ අදියරේදී රැස්කරන තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කිරීම පිණිස පවත්වනු ලබන පශ්චාත් ගණන් ගැනීමේ සමීක්ෂණය 2022 වසරේදීත් සිදුකිරීමට නියමිතය.